# පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් අනාවරණය වන අතීත ලාංකේය ආභරණ භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**මදුෂාන් යූ.ඩී.එස්.**[1]

අතීත ලාංකේය මානවයා තම එදිනදා ජීවිතයේ දී කලාත්මක අංග ඇසුරු කිරීමට යම් නැඹුරුතාවයක් දක්වා ඇත. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය උපයෝගි කර ගනිමින් සමකාලීන ආභරණ කලාව පිළිබද විමර්ශනාත්මක අධ්‍යනයක් මෙහි දී සිදු කෙරේ. අතීත මානවයාගේ කලාත්මක ජීවිතයේ එක් පැතිකඩයක් වූ ආභරණ කලාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් ලැබෙන මූලාශ්‍රමය දායකත්වය කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය පිළිබද රචනා වූ සාහිත්‍යමය මූලාශ්‍රය අධ්‍යනය කිරිම මෙහි ප්‍රධානතම අධ්‍යන ක්‍රමවේදය යි. දහවැනි සියවසට අයත් පුලියන්කුලම පුවරු ලිපියෙහි රජු විසින් දිළින්දන්ගේ සිත් සතුටු කරවීම සදහා නොයෙක් රන් රුවන් දන් දුන් බව කියවේ. මහා පරාක්‍රමබාහු රාජ්‍ය සමයට අයත් දෙවනගල ශිලා ලේඛනයෙහි රජවරුන් විසින් නොයෙක් අවස්ථාවන් වල දී තුටු පඩුරු වශයෙන් ජනයාට ආභරණ පිරිනමනු ලැබූ බව එහි සදහන් වේ. එසේ පිරිනමනු ලැබූ තුටු පඩුරු අතර මැණික්වලින් කළ ආභරණ ඇතුළත් වූ බව කියවේ. එසේ ම ගජබා රජුගේ සෙම්පතියෙකු වූ රක්ඛ හට පරාක්‍රමබාහු රජු විසින් පැළඳ සිටි මැණික් ඔබ්බවන ලද ආභරණ පරිත්‍යාග කළ බව සෙල්ලිපි අනාවරණය කරනු ලබයි. නිශ්ශංකමල්ල රජතුමා ද සිය ගල්පොත ලිපියෙහි රන්, රිදී, මුතු, මැණික් දිළින්දන්ට දුන් බව කියවේ. මේ හරහා අනාවරණය වන්නේ සමකාලීන අවධියේ ආභරණ කලාව දියුණු මට්ටමක පැවත ඇති බව යි. මූර්ති සහ කැටයම්වල ද පුරාණ ආභරණ කලාව පිළිබඳ ඉගි පහළ කොට ඇත. යඨාල දාගැබෙන් සොයාගත් ශෛලමය මිනිස් රුවක ගෙලෙහි ආභරණයක් දක්වා තිබේ. එමෙන් ම රුවන්වැලිසෑයේ කැණීම්වලින් සොයාගත් යක්ෂණී රූපයක මාණික්‍යමය මෙවලමක් දක්වා ඇත. කාන්තා රූප රැසක ම කාන්තාව ආභරණයෙන් සරසා ඇත. සමකාලීන අවධියේ නිර්මිත බෝධිසත්ව රූප මෙන් ම රාජරූපවල ආභරණ බොහෝමයක් දැකගත හැකි ය. එහි මිනිස් රුව අත්‍යාලංකාරයෙන් දක්වා ඇත. උඩුකය ග්‍රිවාභරණ, කර්ණාභරණ හා වළලු වලින් ද එකාවැල් නමින් හදුන්වනු ලබන උරහිස හරහා දමන ලද මුතු පොටකින් නිර්මිත ඉන හැඩයක් ද දක්වා ඇත. කලාත්මක ජීවිතයේ දී විචිත්‍රවත් අංගයන් ද ඇතුළත් කරගත් බව පෙනේ. සීගිරිය, වෙස්සගිරිය, ඉසුරුමුණිය ආදී තැන්වල දක්නට ලැබෙන බිතුසිතුවම්වලින් ද කර්ණාභරණ, ග්‍රිවාභරණ, පා වළලු අන්තර්ගත කොට ඇත. ජේතවන කැණීම්වලින් මතුකරගත් ස්වර්ණාභරණ කැබැල්ලක් සමකාලීන ආභරණ කලාව මනාව විෂද කරයි. අනුරාධපුර මහාපාලි දානශාලාවෙන් හමු වූ දැල්රටා සහිත මාලය, වීදුරු, ටෙරාකොටා හා ලෝහමය පබලු, ඇගේට් වැනි ද්‍රව්‍ය ආභරණ නිපදවීමට යොදාගෙන ඇත. පුරාතන ලංකාවේ ආභරණ භාවිතය පිළිබඳව හැදෑරීමේදී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් මඟින් විශාල පිටිවහලක් ලැබෙන බව පෙන්වාදිය හැකි ය.

**ප්‍රමුඛ පද** : ආභරණ, රන්-රුවන්, මූර්ති, ශිලාලේඛන, මූලාශ්‍රය

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. udsmadushan@gmail.com